# හාඩිය විනාශ මුඛයේ...

1956 සිට මේ දක්වා සිදු වූ ආයතන පරිණාමය තුළ විවිධ අවස්ථාවන් හිදී විවිධ පාර්ශ්වයන්ගේ මැදිහත්වීමෙන් සංවර්ධන වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක වුවද ආරම්භයේ සිටම ආයතනික වශයෙන් පැවැති මුඛ්‍ය පරමාර්ථය වූයේ "හාඩිය" රාජ්‍ය තාක්ෂණ විශ්ව විද්‍යාලයක් බවට පත් කිරීමයි.

වර්තමානය වන විට ඉදිරිපත් වූ නවතම සංවර්ධන ව්‍යාපෘති යෝජනාව හරහා දැනට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය හරහා පාලනය වන හාඩි උසස් තාක්ෂණ ආයතනය නිපුණතා සංවර්ධන, වෘත්තිය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයට පවරා ඇති අතර ව්‍යාපෘතිය හා සම්බන්ධ මෙහෙයුම් පාර්ශ්වය විසින් ඉදිරිපත් කරනු ලැබූ අදහස් සහ එහි ඉදිරි වැඩපිළිවෙළ පහත පරිදි විය.

- නව හාඩි තාක්ෂණ ආයතනය  නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ස්ථාපනය වේ.
- ඇමරිකාවේ MIT පාදක කරගනිමින් මෙම නව ආයතනය ඉදිවෙයි.
- ආයතනයේ පරිපාලන ව්‍යුහය වෙනස් වේ.
- අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය ආදේශනයන් සුදුසුකම් මත හා ඔවුන්ගේ අභිමතය පරිදි සිදු වෙයි.
- නව ආයතනයේ පාඨමාලාවන් වත්මන් ශීර්ෂයන් යටතේ ස්ථාපනය වන අතර නව ප්‍රවණතාවයන්ට උචිත පරිදි නව පාඨමාලාවන් හඳුන්වා දීම සිදු කරයි. (මෙතෙක් සැලසුම් සකස් කර සම්පූර්ණ කර නොමැත.)
- ආයතන ගොඩනැගිලි හා භෞතික සම්පත් සංවර්ධනය.
- වසර කිහිපයක් ඇතුලත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ හෝ විශේෂ පාර්ලිමේන්තු පනතක් යටතේ උපාධි පිරිනැමීමේ මට්ටම දක්වා සංවර්ධනය.

මේ ආකාරයෙන් ඉදිරිපත් කර ඇති වැඩ පිළිවෙළ සැලකූ විට යම්කිසි සංවර්ධනයක් ලෙසින් මතුපිටින් පෙනෙන්නට තිබුණද ඇතුළාන්තයේ සිදුවන කඩා වැටීම හා ආයතන පරිහානිය  සැමට රහසක් ව මෙම වැඩපිළිවෙළ සිදු වෙමින් පවතී.

දැනට පවත්නා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ම මෙම සංවර්ධන වැඩපිළිවෙළ ඉදිරිපත් කළ නොහැක්කේ මන්ද ? ලොව විශිෂ්ටතම තාක්ෂණ ආයතනය පාදක කර ගනිමින් ගෙන එන නව ආයතනය සඳහා රාජ්‍ය විශ්ව විද්‍යාලයකටත් එහා ගිය ප්‍රමිතියක් රාජ්‍ය අමාත්‍යාංශයක් යටතේ ලබා දෙන්නේ කෙසේ ද ?

මේ වන විටත් රාජ්‍ය විශ්ව විද්‍යාලයකට පමණක් දෙවැනි වන මට්ටමක ප්‍රමිතියක් සහිත ආයතනයක් මේ ආකාරයෙන් අවභාවිතයේ යෙදවීම කෙතරම් දුරට නිවැරදිද ? බලධාරීන්ගේ අත්තනෝමතිකයන්ට යටත් ව ලාංකීය නාමය ලොව පුරා රන්දූ විශිෂ්ටතම  තාක්ෂණ ආයතනයේ අනාගතය මෙලෙසින් විනාශ විය යුතුද ? හාඩි උසස් තාක්ෂණ ආයතනයේ සිසුන් වශයෙන් අප සතු පැනය වන්නේ මෙයයි.

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව රාජ්‍ය තාක්ෂණ විශ්ව විද්‍යාලයක් ලෙස ගොඩනැගීමේ හැකියාව පවතින ආයතනයක් මේ ආකාරයෙන්

ස්ව අභිමතයන් ට යටත් ව ගනු ලබන තීරණ ඔස්සේ මෙලෙස අවභාවිතාවේ යෙදවීම කෙතරම් දුරට නිවැරදි දැයි බලධාරීන් දෙවරක් සිතිය යුතු වේ.

## අත්තනෝමතික ආයතන පැවරීම හරහා සිදුවන ආයතන කඩා වැටීම.

ඉහතින් සඳහන් කළ කරුණු සලකා බලා දැනට මෙම ආයතනය මාරුවත් සමග සිදුවන්නා වූ ආයතනික පරිහානිය පහත පරිදි ගොනු කළ හැකිය.

- අධ්‍යාපන අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ පැවති ආයතනයක් රාජ්‍ය අමාත්‍යාංශයක් යටතට පැවරීම නිසා ආයතනයේ පාඨමාලා ඒ ආකාරයෙන් ම පෙර පැවති ශීර්ෂයන් යටතේ ක්‍රියාත්මක වුවද අදාළ පාඨමාලාවන්ගේ ගුණාත්මක භාවය හා පිළිගැනීම මෙන්ම එම පාඨමාලා සහතික කිරීම ඔස්සේ ලැබෙන රැකියා ක්ෂේත්‍රයේ පවත්නා විශේෂිත වූ අවස්ථාවන් යනාදී සියලු දේ අහිමි වීම.
- විශ්වවිද්‍යාල පරිසාධන මට්ටමේ පවත්නා ආයතනයක් වශයෙන් නම් කර ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය සඳහා අප උපාධි පිරිනැමීමේ හැකියාව ලබා ලබා දීමේ වැඩපිළිවෙලේ දී එම උපාධි පිරිනමන ආයතන ලැයිස්තුවේ ඉහළින් ම පැවති ආයතනයක් මේ ආකාරයෙන් අමාත්‍යාංශ මාරුවකට යොමු කිරීම හේතුවෙන් ආයතනයේ එම අවස්ථාව අහිමි වී යාම මෙන්ම එවන් ඉහල මට්ටමක පවත්නා ආයතනයක් මුල සිට අනුක්‍රමික ව ගෙන එනු ලබන සංවර්ධන වැඩපිළිවෙළක් හරහා එම ඉහළ තත්ත්වය ළඟා කර ගැනීමට දීර්ඝ කාලයක් ගත වීම.
- ආයතනයේ අධ්‍යාපනය හදාරන සිසුන් සඳහා ලැබෙන උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පමණක් හිමි වන මහපොළ  ශිෂ්‍යාධාර වැනි විශේෂ වරප්‍රසාද අහිමි වී යාම.
- පාඨමාලා සහතික කිරීමට පවත්නා ඉහළ ප්‍රමිතිය අහිමි වීම.

- **HNDE - ගුරු පත්වීම් සඳහා රජයේ රජයේ ගැසට් නිවේදනයට ප්‍රකාරව ඉදිරිපත් වීමේ හැකියාව.**
- **HNDA- විශ්ව විද්‍යාලයක පිරිණමන b.com උපාධියකට සමාන සහතික කිරීමක් සහිත පාඨමාලාවක් වීම.**
- **අනෙකුත් සියලුම පාඨමාලාවන් ද ඉහළ CREDIT අගයන්ගෙන් යුතු අතර මෙම පැවරීම හේතුවෙන් එම ඉහල ප්‍රමිතිය අහිමි වී යාම.**

- ආචාර්යවරුන් සඳහා ඔවුන්ගේ වෘත්තිය මට්ටමින් හිමි වන පිළිගැනීම සහ වරප්‍රසාද අහිමි වී යාම නිසා රාජ්‍ය අමාත්‍යාංශය යටතේ සේවය කිරීමේ අකමැත්ත හේතුවෙන් දැනට ආයතනය සතු ඉහළ අධ්‍යාපන සුදුසුකම් සහිත ප්‍රවීණ ආචාර්ය මණ්ඩලය ආයතනයට අහිමි වීම.
- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පැවතීම නිසා ආයතනය සඳහා වූ සිසුන්ගේ ඉල්ලුම පහත වැටීම.
- දැනට SLQF මට්ටමේ සහතික කිරීමක් හිමි වන අතර මෙම  අමාත්‍යාංශ මාරුව හරහා NVQ මට්ටමේ සහතික කිරීමක් පමණක් හිමි වීම.
- සැලසුම් සකස් කර අවසන් වීමටත් ප්‍රථම ව සිදුකර ඇති මෙම අත්තනෝමතික ආයතන හිමිකම් මාරුව හේතුවෙන් හාඩි උසස් තාක්ෂණ ආයතනය වෙනුවෙන් එළැඹෙන 2022 වර්ෂයේ දී සිදු

කරනු ලබන නවක ශිෂ්‍ය බඳවා ගැනීම් නවතා ඇත. මෙම වසරේ අවසානයේ දී නිකුත් කිරීමට නියමිත SLIATE සඳහා සිසුන් බඳවා ගැනීම වෙනුවෙන් නිකුත් කරන ගැසට් නිවේදනයෙන් හාඩි උසස් තාක්ෂණ ආයතනය ඉවත් කර ඇති බව පවසයි.

- ඒත් සමගම ආයතනය සඳහා වෙන් වන ප්‍රතිපාදන වෙන් කිරීම් ද මේ වනවිට අත්හිටුවා ඇත. මෙවන් තත්ත්වයක් උද්ගත වී ඇති බැවින් එය ආයතනයේ අඛණ්ඩ පැවැත්මට මහත් වූ තර්ජනය එල්ල කරයි.

මෙම ගැටලුකාරී තත්ත්වය සැලකිල්ලට ගනිමින් විනාශ මුඛයට ඇද වැටී ඇති හාඩි උසස් තාක්ෂණ ආයතනය සුරක්ෂිත කර ගැනීමේ අරමුණ හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ රාජ්‍ය තාක්ෂණ විශ්වවිද්‍යාලයක් ලෙස ගොඩ නැංවීමේ අරමුණ පෙරදැරි ව හාඩි උසස් තාක්ෂණ ආයතනික සිසුන් වශයෙන් අප දැඩි ලෙස ප්‍රකාශ කරනුයේ අත්තනෝමතික ලෙස ආයතනය පවරා දෙමින් නිකුත් කරනු ලැබූ අංක 2228-10 දරණ විශේෂ ගැසට් නිවේදනය වහා අහෝසි කරන ලෙසයි. එලෙස ම හාඩි උසස් තාක්ෂණ ආයතනය නැවතත් SLIATE යටතට පවරා දෙන ලෙසයි.

ස්තුතියි,

හාඩි මහා ශිෂ්‍ය සංගමය.